# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2115/54 - 2019 මාර්තු මස 23 වැනි සෙනසුරාදා - 2019.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ 2019 ............. අංක දරන

ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශ ප්‍රඥප්ති කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

02. මෙම දැන්වීම *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වීමෙන් පසු දින 10 ක් ඉක්ම ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 ක් තුළ දී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

බාලගේ සාලිය සුමේධ ද සිල්වා,<br>
ඌව පළාතේ ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක,<br>
ප්‍රවාහන, සංස්කෘතික, පේෂ කර්මාන්ත හා<br>
කුඩා කර්මාන්ත අමාත්‍යාංශය, ඌව පළාත් සභාව,<br>
බදුල්ල.

2019 ක් වූ මාර්තු මස 14 වැනි දින,<br>
ඌව පළාතේ ක්‍රීඩා හා යෞවන කටයුතු,<br>
සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත<br>
අමාත්‍යාංශය, ඌව පළාත් සභාව,<br>
බදුල්ල, අමාත්‍ය කාර්යාලයේ දී ය.


1A - PG 4443 — 20 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඌව පළාතේ පළාත් සභාවේ

## 2019 අංක ...... දරන සංචාරක සංවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය

ඌව පළාත තුළ සංචාරක කර්මාන්තය සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම සඳහා ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශයක් පිහිටුවීම හා ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශංගික වෙනත් සියලු කරුණු සඳහා විධිවිධාන සැලස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2019 අංක .......... දරන ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

### I කොටස

### ඌව පළාතේ සංචාරක සංවර්ධන කාර්යාංශය පිහිටුවීම

ඌව පළාත් සංචාරක කාර්යාංශයක් පිහිටුවීම

2. (1) මෙම ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ සඳහන් කරනු ලබන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා (මෙහි මින් මතු ''කාර්යාංශය'' යනුවෙන් හඳුන්වනු ලබන) ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය නමින් හඳුන්වනු ලබන කාර්යාංශයක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) කාර්යාංශය (1) වන උප වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. කාර්යාංශය විසින් ද කාර්යාංශයට විරුද්ධව ද කාර්යාංශය නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ පරමාර්ථ

3. කාර්යාංශයේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය :-

(1) සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්ති වලට අනුරූපීව ඌව පළාත තුළ ප්‍රතිපත්ති, උපක්‍රමික සැලසුම් සකස් කිරීම හා ඒ මත පදනම් වූ වැඩසටහන් කාර්යක්ෂමව සහ සඵලදායීව ක්‍රියාත්මක කිරීම.

(2) සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශයක් තුළ දෙස් විදෙස් සංචාරකයින්, හෝටල් හිමියන්, සංචාරක මාර්ගෝපදේශකයින්, දේශීය, විදේශීය රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන ඇතුළු සංචාරක කර්මාන්තය හා සම්බන්ධ විවිධ පාර්ශ්ව සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

(3) දැනට සංචාරකයින් අතර ප්‍රචලිත ඌව පළාතේ සංචාරක ආකර්ශන සහිත ස්ථානයන්හි පහසුකම් සංවර්ධනය තුළින් දෙස් විදෙස් සංචාරකයින්හට පහසුවෙන් හා සුරක්ෂිතව ඌව පළාතේ අසිරිය විඳීමට අවස්ථාව සැලසීම සහ ඌව පළාතේ සංචාරක ආකර්ශන වශයෙන් ප්‍රචලිත ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් අනාගත පරපුරේ උරුමය වෙනුවෙන් සංරක්ෂණය කිරීම.

(4) ඌව පළාත තුළ නව සංචාරක ආකර්ශනයන් හඳුනා ගැනීම, සංවර්ධන සැලසුම් සකස් කිරීම, පළාත් සභා අරමුදලින් සහ දේශීය විදේශීය වෙනත් මූලාශ්‍රවලින් අරමුදල් සපයා ගනිමින් ඌව පළාතේ සුන්දරත්වය ඔප්නැංවෙන ආකාරයෙන් තිරසාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(5) සංචාරක කර්මාන්තය ආශ්‍රිතව සෘජු හා වක්‍ර සේවා නියුක්තිකයන්ගේ හා ව්‍යවසායකයින්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කිරීම හා රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

(6) පළාතේ තරුණ තරුණියන්ට සංචාරක හා ආගන්තුක සත්කාර විෂයයෙහි වෘත්තීය පුහුණුව සහ වෘත්තීය මාර්ගෝපදේශන ලබා දීම තුළින් පළාතේ මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම.

(7) නව සංචාරක වෙළඳපල හඳුනාගැනීම, ඉලක්ක වෙළඳපල බණ්ඩනය කිරීම සහ උපක්‍රමික අලෙවිකරණ ප්‍රවේශයන් භාවිතා කරමින් ඌව පළාත සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රචාරණය හා ප්‍රවර්ධනය සඳහා අඛණ්ඩ වැඩ පිළිවෙලක් සැකසීම.

(8) දේශීය හා විදේශීය විද්වතුන් හා ආයතන සම්බන්ධීකරණය කරගනිමින් සංචාරක විෂයයට අදාළ නව දැනුම නිර්මාණය කරගැනීමත්, දේශීය අත්දැකීම් හුවමාරු කරගැනීමත් තුළින් පළාතේ සංචාරක කර්මාන්තයේ තිරසාරභාවය සහතික කිරීම.

කාර්යාංශයේ කාර්යය හා කර්තව්‍ය

4. කාර්යාංශයේ කාර්යය හා කර්තව්‍ය පහත දක්වෙන පරිදි විය යුතු ය :-

(1) 2005 අංක 38 දරන සංචාරක සංවර්ධන පනත හෝ එහි රෙගුලාසිවලට ඇතුළත් නොවන ඌව පළාත තුළ දැනට ක්‍රියාත්මක වන සංචාරක හෝටල් හා ලැගුම්හල් ලියාපදිංචි කිරීම හා අලුතින් ආරම්භ කරන සංචාරක හෝටල් හා ලැගුම්හල් සඳහා අනුමැතිය ලබාදීම හා ලියාපදිංචි කිරීම.

(2) ඌව පළාතේ සංචාරක කර්මාන්තයේ ගුණාත්මක සංවර්ධනය සඳහා සංචාරක හෝටල් සහ අනෙකුත් සේවා සපයන්නන් නියාමනය, අධීක්ෂණය හා ප්‍රමිතිය සහතික කොට බලපත්‍ර නිකුත් කිරීම, ඒ සඳහා ගාස්තු නියම කිරීම සහ එකී ගාස්තු එක්රැස් කිරීමට කටයුතු කිරීම.

(3) ඌව පළාත තුළ ප්‍රචලිත හා ප්‍රචලිත නොවන සංචාරක ආකර්ශන සහිත ස්ථාන පිළිබඳව දැනුවත් කිරීමට හා සංචාරක ආකර්ශනය ඉහළ නැංවීමට ඉවහල්වන ප්‍රකාශන, ඡායාරූප, වීඩියෝ පට, සිතියම් හෝ වෙනත් ප්‍රදර්ශන භාණ්ඩ නිර්මාණය කිරීම හා බෙදා හැරීමත්, ඌව පළාතේ සංචාරක ගමනාන්තවල ප්‍රතිරූපය ඉහළ නැංවෙන ආකාරයට පළාතේ සංචාරක ආකර්ශන සහිත ස්ථානවල තොරතුරු ඇතුළත් වෙබ් අඩවි, සංචාරක මාර්ගෝපදේශනයට අදාළ මෘදුකාංග නිර්මාණය කිරීම හෝ වෙනත් තාක්ෂණික පහසුකම් ඇති කිරීම.

(4) දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ අරමුණු කර ගනිමින් සංචාරක ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, පිළිගත් විශ්වවිද්‍යාල හා වෙනත් එවැනි ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම, පුහුණු පාඨමාලා හා පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

(5) ඌව පළාතේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය සඳහා රජයේ නිලධාරින් සහ කර්මාන්තකරුවන් සඳහා දේශීය, විදේශීය අත්දැකීම් හුවමාරු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය, සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම තුළින් සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා නව දැනුම සහ විශිෂ්ට මගපෙන්වීම් ලබා ගැනීම හා ඒවා සඵලදායිව යොදාගැනීම.

(6) ඌව පළාතේ සංචාරක ආකර්ශණීය ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක මාර්ග සංවර්ධනය කිරීම, සංචාරක විවේකාංගන, තොරතුරු මධ්‍යස්ථාන, සංචාරක සුවපහසු මධ්‍යස්ථාන, විනෝද ක්‍රීඩා පහසුකම් සහ ශාරීරික ව්‍යායාම් මධ්‍යස්ථාන ඇති කිරීම, පවත්වාගෙන යාම සහ ඒ සඳහා ගාස්තු අය කිරීම.

(7) සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට සෘජුව දායක වන සංචාරක හෝටල් හා සංචාරක අලෙවිසැල් සඳහා පහසුකම් සැලසීම, සංචාරක කර්මාන්තකරුවන්ට සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතා සහ අභියෝග පිළිබඳව දැනුවත් කිරීම සහ සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම.

(8) සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් අරමුදල් සපයා ගැනීම, ආයෝජනය දිරිමත් කිරීම, මානව හා භෞතික සම්පත් සමායෝජනය තුළින් අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා කාර්යාංශයේ කාර්යය මණ්ඩලය මෙහෙය වීම.

(9) කාර්යාංශයේ කාර්යය මණ්ඩල අවශ්‍යතාවයට අනුව සේවකයින් බඳවා ගැනීම, පුහුණු කිරීම හා ධාරිතා සංවර්ධනය තුළින් ප්‍රශස්ථ කාර්යය මණ්ඩලයක් ගොඩනැගීම සහ කාර්යාංශයේ සේවකයන් සම්බන්ධයෙන් කාර්ය නියාමනයන් ඇති කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ පසු පෝෂණය කිරීම.

(10) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය චංචල හෝ නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම හා දැරීම, බදු හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, හුවමාරු කිරීම, විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම, යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ හා ද්‍රව්‍ය ආනයනය කිරීම සහ කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ද්‍රව්‍ය, උපකරණ, මූල්‍යාධාර, කාර්යය මණ්ඩල හා වෙනත් ආධාර පිළිගැනීම සහ වෙනත් පාර්ශ්වයන්ට ලබා දීම.

## II කොටස

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

5. (1) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් විය යුතු අතර, එම මණ්ඩලය නිලබලැති සාමාජිකයින් පස් දෙනෙකුගෙන් ද නම් කරනු ලබන සාමාජික සිව් දෙනෙකුගෙන් ද සමන්විත විය යුතු ය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයින් පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය.

(අ) ඌව පළාත් සංචාරක විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනු ලබන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ;
(ආ) පළාත් පාලන කොමසාරිස් හෝ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන නිලධාරියෙක් ;
(ඇ) ඌව පළාත් සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ නිලධාරියෙක් ;
(ඈ) සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරියෙක් ;
(ඉ) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් නම් කරනු ලබන සංචාරක හා හෝටල් කළමනාකරණ අංශයේ කථිකාචාර්යවරයෙකු.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නම් කරනු ලබන සාමාජිකයින් පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය.

(අ) විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික් හෝටල් හිමියන්ගේ සංගමයේ නියෝජිතයන් දෙදෙනෙක් ;
(ආ) විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සංචාරක මග පෙන්වන්නන්ගේ සංගමය නියෝජනය කරන නියෝජිතයෙක් ;
(ඇ) සංචාරක ක්ෂේත්‍රයට අදාළ විශේෂඥ දැනුම ඇති අයගෙන් විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්.

(4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරීක්ෂකයින් වශයෙන් රැස්වීම් වලට සහභාගී වීමට සුදුසු යැයි හැඟෙන සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය දරන නැතහොත් කාර්යාංශයේ පරමාර්ථ ඉටු කරවා ගැනීමට අවශ්‍ය දැනුම හා හැකියාව සහිත පුද්ගලයින්ට ආරාධනය කරනු ලැබීය හැකි ය.

(5) නම් කරනු ලබන සාමාජිකයෙකු සිය ධූරය අතහැර යෑමෙන් හෝ නියමිත කාලයට පෙර නිල බලැති සාමාජිකයකු නම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ නම් කළ සාමාජිකයකු නම් අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබුනහොත් මිස සෑම සාමාජිකයෙක්ම පත්කරන ලද දින සිට අවුරුදු තුනක කාලයක් සිය ධූරය දැරිය යුතු ය.

කාර්යාංශයේ සභාපතිවරයා

(6) (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් අතරින් සංචාරක හා හෝටල් කළමනාකරණ විෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් සහිත පුද්ගලයෙකු කාර්යාංශයේ සභාපතිවරයා ලෙස විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කළ යුතු ය. සභාපතිවරයා අවුරුදු තුනක කාලයක් සිය ධූරය දැරිය යුතු ය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතු ය.

(8) විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ ප්‍රමාණවලට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට පැමිණීම අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

කාර්යාංශයේ කළමණාකරන අධ්‍යක්ෂවරයා

6. (1) කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වශයෙන් සංචාරක කර්මාන්තය පිළිබඳව සුදුසුකම්ලත් යෝග්‍ය වූ තැනැත්තෙකු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු අතර, ඔහු කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු ය.

(2) කළමණාකරන අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ ඔහු විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී ඔහු වෙත පනවන ලද හෝ පවරා දෙන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් කාර්යාංශයේ යම් නිළධරයෙකු වෙත අභිනියෝජනය කල හැකි අතර, එම නිලධරයා විසින් කළමණාකරන අධ්‍යක්ෂවරයාගේ විධානයට හා පාලනයට යටත්ව එම කාර්යය හෝ කර්තව්‍යය ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. කළමණාකරන අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ කාර්යයන් අභිනියෝජනය කළ හැකි බව

(3) අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු රැස්වීම් සඳහා සහභාගිවීමට හා එහි දී කථා කිරීමට ද කළමණාකරන අධ්‍යක්ෂවරයාට හිමිකම තිබිය යුතු නමුත් එවැනි රැස්වීම් වලදී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(4) කළමණාකරන අධ්‍යක්ෂවරයා සභාපතිවරයාගේත්, අධ්‍යක්ෂ මණ්ඩලයේත් පොදු විධානයට හා පාලනයට යටත්ව කාර්යාංශයේ නිලධරයන් හා සේවකයින්ගේ පරිපාලනය ඇතුළුව කාර්යාංශයේ සියලු කටයුතු පවත්වාගෙන යාම සඳහා කටයුතු කළ යුතු ය.

(5) පළාත් සභාවේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් කළමනාකරණ අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(6) කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය වසර තුනක් වන අතර විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව කළමනාකරණ අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(7) අසනීපවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා කළමනාකරණ අධ්‍යක්ෂවරයාට ඔහුගේ යම් කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවලදී අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ද එකඟත්වය ඇතිව එම නොපැමිණ සිටින කාලය තුළ දී ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා කාර්යාංශයේ වෙනත් යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය.

(8) කාර්යාංශයේ සියළුම පරිපාලන කටයුතු පිළිබඳව කළමනාකරණ අධ්‍යක්ෂ වගකිව යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ වෙත පවරනු ලබන බලතල, කාර්ය හා වගකීම් ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමටද, මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට යටත්ව :-

(අ) කාර්යාංශය විසින් සේවයේ යොදවා ඇති නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ කුසලතා වර්ධනය ;

(ආ) කාර්යාංශයේ පරමාර්ථ සාක්ෂාත් කිරීමෙහි ලා කාර්යාංශයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම ;

(ඇ) කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම ;

කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ කාර්ය භාරය වන්නේ ය.

7. (1) කාර්යාංශයට සේවකයින් බඳවා ගැනීමේදී කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමෙන් අනතුරුව නිශ්චිත බඳවා ගැනීම් පටිපාටිය අනුගමනය කර සේවකයින් බඳවා ගත යුතු ය. කාර්යාංශයේ කාර්ය මණ්ඩල පත්කිරීම

(2) කාර්යාංශයේ සේවකයන් විසින් රාජකාරි කටයුතු සිදු කිරීමේ දී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර වර පනවනු ලබන නියෝගයන් අනුගමනය කළ යුතු ය.

## III කොටස

## මුදල්

කාර්යාංශයේ ගිණුම

8. කාර්යාංශයට කාර්යාංශයේ නමින් අනුමත බැංකුවක වෙනම ගිණුමක් තිබිය යුතු ය.

මුදල්

(1) පහත දැක්වෙන මුදල් කාර්යාංශයේ ගිණුමට ගෙවනු ලැබිය යුතු ය :-

(අ) කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා ඌව පළාත් සභාව විසින් කලින් කළ සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආණ්ඩුව මගින් ප්‍රදානය කරනු ලබන සියලු මුදල් ;

(ඇ) ප්‍රදාන, පරිත්‍යාග සහ ත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් ;

(ඈ) මෙම ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ කාර්යාංශයේ ගිණුමට අන්‍යාකාරයෙන් බැර කරනු ලබන වෙනත් සියලු මුදල් ;

(ඉ) සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සේවා පිහිටුවීම සඳහා උපදේශක සේවාවන් බාහිර පුද්ගලයින්ට හෝ ආයතනවලට ලබාදීම තුළින් ලබන ආදායම ;

(ඊ) සංචාරක සංවර්ධන අරමුණු සඳහා නියමිත ස්ථාන පිහිටුවීමේ දී පළාත් පාලන ආයතනවලට උපදේශන ලබාදීම තුළින් ලබන ආදායම ;

(උ) ශ්‍රී ලංකා සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ ආයතනය විසින් සිදු කරනු ලබන ඒ හා ආශ්‍රිත වෙනත් පුහුණු වැඩසටහන්, ආගන්තුක සත්කාර ආශ්‍රිත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් ලැබෙන සියලු මුදල් ;

(ඌ) සංචාරක ව්‍යාපාරය සම්බන්ධිත කරුණු (උපදේශන ග්‍රන්ථ, අත් පත්‍රිකා, පැහැදිළි දෘශ්‍ය පටිගත කිරීම් හා ඒ හා සම්බන්ධ වෙනත් දේ) පළ කිරීම මගින් ලැබෙන සියලු මුදල් ;

(එ) සිහිවටන හෝ සමරු තිළිණ නිර්මාණය කිරීමේ යෙදී සිටින කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් උදෙසා අගය එකතු වන පුහුණු වැඩසටහන් මගින් රැස් කරන මුදල් ;

(ඒ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත පනතක් මගින් කාර්යාංශයේ ගිණුමට ලැබෙන වෙනත් සියලු මුදල් ;

(2) කාර්යාංශයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කර්තව්‍යය හා කාර්යය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

9. කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

10. කාර්යාංශය විසින් ආදායම හා වියදම සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද වෙනත් සියලු කරුණු සම්බන්ධයෙන් ද නිසි ගිණුම් පොත් තබා ගැනීමට වගබලා ගත යුතු ය.

11. විගණනය සම්බන්ධයෙන් 1987 වසරේ අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) සහ 23 (2) යන වගන්ති අදාළ වන අතර, ඌව පළාත් සභා සංචාරක කාර්යාංශයේ ගිණුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපති විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයෙකු විසින් වාර්ෂිකව විගණනය කිරීම සිදු කළ යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

12. (1) දීර්ඝ කාලීන සංවර්ධන සැලසුම් වලට අනුකූලව කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් එක් එක් වර්ෂයක දී ඊළඟ වර්ෂය සඳහා වන වාර්ෂික සංවර්ධන සැලසුම් සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර පිළියෙළ කර එයට අනුගාමීව අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

(2) කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් එක් එක් වර්ෂයක දී පෙර වර්ෂය හා අදාළ කටයුතු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සෑම වර්ෂයක ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන වාර්තාව අමාත්‍යවරයා වෙත සෑම වර්ෂයකම ජූනි මස 31 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(4) අමාත්‍යවරයාට එම වාර්තාව ලැබී මාස තුනක් ඇතුළත එම වාර්තාව ඌව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

13. අමාත්‍යවරයා විසින් කලින් කළ මෙම ප්‍රඥප්තිය යටතේ වන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය වෙත පොදු හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

14. කාර්යාංශයේ සියලු සාමාජිකයින් සහ අධිකාරියේ නිලධරයන්, සේවකයන් හා නියෝජිතයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයින් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

කාර්යාංශයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

15. අල්ලස් පනතේ අර්ථානුකූලව මෙම කාර්යාංශය උප ලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලබන අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

කාර්යාංශය අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව

16. (1) මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය විසින් සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවකට එරෙහි වන හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් විධානයක් මත හෝ මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයෙකු විසින් සද්භාවයෙන් සිදු කරනු ලදැයි කියනු ලබන යම් ක්‍රියාවකට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයේ විධානය මත කාර්යාංශය විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එකී ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් සිදු කරනු ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම් (1) උප වගන්තිය යටතේ සඳහන් එවැනි යම් තැනැත්තෙකු විසින් දරන ලද යම් වියදම් කාර්යාංශයේ ගිණුමෙන් ගෙවනු ලැබිය යුතු ය.

17. (1) නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය මගින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියළු කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සම්පාදනය කළ හැකි ය.

අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ හෝ එම නියෝග වලින් නිශ්චිත කරනු ලැබූ ආකාරයේ ඊට පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමත දිනයේ සිට එකී නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) ඉහත (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග පළාත් සභාවේ සම්මත වීමෙන් පසුව ඒවා මෙම ප්‍රඥප්තිය මගින් පැනවූවාක් මෙන් බලාත්මක විය යුතු ය.

වැරදි හා දණ්ඩන

18. මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියෙහි - ''පළාත් සභාව'' යන්නෙන් ඌව පළාතේ පළාත් සභාව ද, ''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා ද, ''අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ සංචාරක විෂය භාර අමාත්‍යවරයා ද, ''අමාත්‍යාංශයේ ලේකම්'' යන්නෙන්, ඌව පළාතේ සංචාරක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද, ''අනුමත බැංකුව'' යන්නෙන් ඌව පළාත් සභාවේ සංචාරක විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත අනුමත කරන ලද රාජ්‍ය බැංකුවක් ද, යනුවෙන් අර්ථ දැක්විය යුතු වන්නේ ය.

භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපවතින බව අදහස් වේ.

20. මේ පනතේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

04 - 202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.